
# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව


2021 දෙසැම්බර්
03 වෙළුම 12 නිකුතුව

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2021 වසරේ දෙසැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,156ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 19.9කින් ඉහළ ගියේය.

2021 වසරේ දෙසැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 2,241ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 46.8කින් ඉහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)





2021 වසර තුළ දී අපනයන ආදායම සහ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 24.4කින් සහ සියයට 28.5කින් ඉහළ ගියේය.


වෙළඳ ගිණුමේ හිඟය, 2020 වසරේ දෙසැම්බර් මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 562ට සාපේක්ෂව, 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,085ක් දක්වා වැඩි විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2021 ජන.- දෙසැ.)

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන)





### ආනයන (එ.ජ. ඩොලර් මිලියන)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.- දෙසැ.)




### අපනයන පරිමා හා මිල දර්ශක (ජන. - දෙසැ.)




සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන්, 2021 වසර තුළ දී අපනයන ආදායම, 2020 වසරට සාපේක්ෂව ඉහළ ගියේය.


2021 වසර තුළ දී අපනයන පරිමා දර්ශකය සහ මිල දර්ශකය පෙර වසරට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 17.1කින් සහ සියයට 6.2කින් ඉහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-දෙසැ.)




### තේ සහ රබර් මිල ගණන් *





* කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වන අතර 2020 වසරේ අප්‍රේල් - අගෝස්තු කාලපරිච්ඡේදයේ දී රබර් වෙන්දේසි මිල ගණන් නොමැත.


ප්‍රධාන වශයෙන්, කුළුබඩු, මුහුදු ආහාර, තේ සහ පොල් අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන්, 2021 වසර තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේ වුවත්, 2021 වසර තුළ දී එළවළු අපනයන ආදායම පහත වැටුණි.

## කාර්මික අපනයන


### කාර්මික අපනයන ආදායම





### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-දෙසැ.)





### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2021 වසර තුළ දී කාර්මික අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්, රෙදිපිළි හා ඇඟලුම්, රබර් නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවත්, 2021 වසර තුළ දී ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියේය.

## ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - (ජන.-දෙසැ.)





### ආනයන පරිමා හා මිල දර්ශකය (ජන. -දෙසැ.)





සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන වියදම් ඉහළ යෑම හේතුවෙන්, පෙර වසරට සාපේක්ෂව 2021 වසර තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, 2021 වසර තුළ දී ආනයන පරිමා දර්ශකය සහ මිල දර්ශකය පෙර වසරට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 11.5කින් සහ සියයට 15.2කින් ඉහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-දෙසැ.)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය





පෞද්ගලික රථවාහන ආනයන වියදම පහළ යෑම හමුවේ වුව ද, 2021 වසර තුළ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව ඉහළ ගිය අතර, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, විදුලි සංදේශ මෙවලම් සහ ගෘහ උපකරණ ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මුහුදු ආහාර, කිරි නිෂ්පාදිත සහ පාන වර්ග ආනයන වියදම පහළ ගිය ද, තෙල් සහ මේද, ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත සහ රබර් නිෂ්පාදිත ආනයන වියදම ඉහළ යෑමත් සමඟ 2021 වසරේ දී ආහාර හා පාන වර්ග ආනයන වියදම ද ඉහළ ගියේය.

# අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



### අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-දෙසැ.)




### බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)





*2021 වසරේ මාර්තු, ජූනි,සැප්තැම්බර් සහ නොවැම්බර් මාසවල බොරතෙල් ආනයනය කර නැත.


ප්‍රධාන වශයෙන්, ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, මූල ලෝහ, රසායනික නිෂ්පාදිත සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2021 වසර තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වුව ද, 2021 වසර තුළ දී පොහොර, සකස් නොකළ දුම්කොළ සහ ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම පහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


### ආයෝජන භාණ්ඩ ආනයන වියදම




### ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-දෙසැ.)




සියලුම උප කාණ්ඩ වල ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, පෙර වසරට සාපේක්ෂව, 2021 වසර තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | දෙසැ.- 20 | දෙසැ. - 21 | වෙනස (%) | ජන. -දෙසැ. 2020 | ජන.-දෙසැ. 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **203.3** | **232.3** | **14.3** | **2,336.2** | **2,729.5** | **16.8** |
| එයින් | තේ | 113.0 | 110.6 | -2.1 | 1,240.9 | 1,324.4 | 6.7 |
| | පොල් | 26.8 | 31.4 | 17.2 | 345.2 | 425.2 | 23.2 |
| | කුළුබඩු | 33.1 | 43.7 | 32.0 | 333.5 | 454.8 | 36.4 |
| | මුහුදු ආහාර | 14.4 | 26.7 | 85.2 | 189.8 | 274.1 | 44.4 |
| **කාර්මික අපනයන** | | **755.5** | **916.7** | **21.3** | **7,672.0** | **9,705.1** | **26.5** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 451.8 | 533.2 | 18.0 | 4,423.1 | 5,435.1 | 22.9 |
| | රබර් නිෂ්පාදිත | 74.9 | 90.3 | 20.5 | 786.1 | 1,050.4 | 33.6 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 31.2 | 51.0 | 63.5 | 373.6 | 506.4 | 35.6 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 41.4 | 57.4 | 38.8 | 464.0 | 586.9 | 26.5 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 39.6 | 43.2 | 9.3 | 337.5 | 500.9 | 48.4 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 18.7 | 23.2 | 24.2 | 181.5 | 279.8 | 54.2 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 4.4 | 6.4 | 44.1 | 53.9 | 58.4 | 8.2 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **5.6** | **7.3** | **28.9** | **39.2** | **67.1** | **71.1** |
| **මුළු අපනයන** | | **964.5** | **1,156.3** | **19.9** | **10,047.4** | **12,501.7** | **24.4** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | දෙසැ.- 20 | දෙසැ. - 21 | වෙනස (%) | ජන. -දෙසැ. 2020 | ජන.-දෙසැ. 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **327.7** | **419.3** | **27.9** | **3,401.7** | **3,848.7** | **13.1** |
| ආහාර හා පාන වර්ග | | 158.1 | 171.2 | 8.3 | 1,554.4 | 1,666.5 | 7.2 |
| එයින් | එළවළු (ආ) | 39.6 | 33.2 | -16.1 | 352.9 | 384.3 | 8.9 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | | 169.7 | 248.1 | 46.2 | 1,847.3 | 2,182.2 | 18.1 |
| එයින් | පෞද්ගලික රථවාහන | 0.5 | 0.6 | 23.0 | 282.9 | 12.8 | -95.5 |
| **අන්තර් භාණ්ඩ** | | **865.0** | **1,368.3** | **58.2** | **9,076.5** | **12,308.9** | **35.6** |
| එයින් | ඉන්ධන | 235.1 | 442.5 | 88.2 | 2,542.6 | 3,742.9 | 47.2 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 234.8 | 297.9 | 26.9 | 2,335.1 | 3,066.9 | 31.3 |
| | පොහොර | 30.4 | 36.9 | 21.2 | 258.9 | 158.2 | -38.9 |
| | තිරිඟු හා ඉරිඟු | 41.9 | 30.2 | -27.8 | 384.4 | 418.3 | 8.8 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **333.9** | **453.4** | **35.8** | **3,577.2** | **4,479.8** | **25.2** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 211.2 | 307.7 | 45.7 | 2,176.1 | 2,809.5 | 29.1 |
| **මුළු ආනයන** | | **1,526.6** | **2,241.0** | **46.8** | **16,055.4** | **20,637.4** | **28.5** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | දෙසැ.- 20 | දෙසැ. - 21 | වෙනස (%) | ජන. -දෙසැ. 2020 | ජන.-දෙසැ. 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -562.2 | -1,084.7 | | -6,007.9 | -8,135.7 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | දෙසැ.- 20 | දෙසැ. - 21 | වෙනස (%) | ජන. -දෙසැ. 2020 | ජන.-දෙසැ. 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | |
| වටිනාකම් දර්ශකය | 134.2 | 160.9 | 19.9 | 116.5 | 145.0 | 24.4 |
| පරිමා දර්ශකය | 167.5 | 167.7 | 0.2 | 132.9 | 155.7 | 17.1 |
| මිල දර්ශකය | 80.2 | 96.0 | 19.7 | 87.7 | 93.1 | 6.2 |
| **ආනයන** | | | | | | |
| වටිනාකම් දර්ශකය | 136.6 | 200.6 | 46.8 | 119.7 | 153.9 | 28.5 |
| පරිමා දර්ශකය | 156.9 | 201.3 | 28.3 | 145.5 | 162.2 | 11.5 |
| මිල දර්ශකය | 87.1 | 99.6 | 14.4 | 82.3 | 94.9 | 15.2 |
| **වෙළඳ මිල අනුපාතය** | 92.0 | 96.3 | 4.6 | 106.5 | 98.2 | -7.8 |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද